# කතුවැකිය

### කසළ ගැටලුව අවම කිරීමෙහිලා අපගේ කාර්යභාරය

කසළ, කුණු, අපද්‍රව්‍ය ආදී වශයෙන් කවර ලෙස හැඳින්වුවද මේවා හේතුවෙන් ඇතිව ඇති අර්බුදය මෙරට සමාජ, ආර්ථික ගැටලු පමණක් නොව දේශපාලනමය ගැටලුවක්ද, නිර්මාණය කර ඇති බව පෙනේ. මෙම ගැටලුවට මුල්වන්නේ වෙනත් ලොවකින් හෝ අහසින් කඩාවැටුන දේවල් නොවේ. අප, අප විසින්ම අපගේ එදිනෙදා ජීවිතයේදී සිදුකරන ක්‍රියාකාරකම් නිසා ජනිතවන දේය. ඒවා කුණු - කසළ හෝ අපද්‍රව්‍ය බවට පත්වන්නේ තවදුරටත් ඒවා භාවිත කිරීමට අප ඉදිරිපත් නොවන නිසාය.

අප එකිනෙකා වගකීමෙන් යුතුව සිතුවහොත් හෝ ක්‍රියාකළ හොත් මෙම ගැටලුව, මෙතරම් අසාධ්‍ය නොවන්නට තිබිණ. අප විසින් "නිපදවනු" ලබන කසළ භාවිතයෙන් ඉවත් කිරීම සඳහා සක්‍රියව ක්‍රියාකිරීමට අපට හැකිවුවහොත් මෙම ගැටලුව මතුනොවීමට ඉඩ නොතිබුන බව සැමට වැටහෙනවා ඇත. එහෙත් අප හුරුව ඇත්තේ අප උපදවන කසළ ඉවත් කිරීම රජය හෝ පළාත් පාලන ආයතන මගින් සිදුකරනු දැකීමටය. අදාළ ආයතනවලට බදු ගෙවන නිසා එය සිදුකිරීමට ඔවුන් බැඳී සිටින බව යම් සත්‍යයක් වුවද, වගකීමෙන් තොරව ඔබ සිදුකරන මෙම කාර්යයේ සියළු බර දැරීමට තරම් ඔවුන්ට සම්පත් නොමැති බවද වටහාගත යුතුය.

කසළ හා අපද්‍රව්‍ය මහා ගැටළුවක් ලෙස අප දුටුවද ලෝකයේ බොහෝ රටවල් කසළ සම්පතක් බවට පත්කරගෙන ඇත. ඒ රටවල් විදුලිය නිපදවීමට, ගොහොරු බිම් සනීපාරක්ෂක ලෙස ගොඩකිරීමට, උද්‍යාන සකස් කිරීමට, පොහොර නිපදවීමට කසළ යොදාගන්නා බව ලොව දසතින් ලැබෙන තොරතුරු තුළින් පැහැදිලි වෙයි. අපට එතරම් ඈත නොවන සිංගප්පූරුව හා ඊශ්‍රායලය වැනි රටවල කසළවලින් ගොඩ කළ බිම්, ළමා උද්‍යාන වැනි විසිතුරු බිම් බවට පත්කර ඇත්තේ නවීන තාක්‍ෂණය කදිමට උපයෝගී කරගනිමිනි. කොතැනක හෝ එක්රැස්වන කසළ තවත් තැනකට ගොස් හැලීම නිසිලෙස කසළ කළමනාකරණයක් ලෙස කිසිසේත්ම හැඳින්විය නොහැකිය. ඒ තමන්ගේ හිසරදය තවත් කෙනෙකු අත පත් කිරීමක් පමණය.

කසළ නිසිලෙස එක්රැස් කිරීමත්, ඒවා මිනිස්, සත්ව හා ශාක ප්‍රජාවන්ට හානි නොවන ලෙස ඉවත් කිරීමත් රජයේ සහ පළාත් පාලන ආයතනවල වගකීම බවට සැකයක් නැත. එහෙත් වගකිවයුතු පුරවැසියන් ලෙස අප එදිනෙදා උපදවන කසළ ප්‍රමාණය අවම කිරීම අප වෙත පැටවෙන වගකීමක් හා යුතුකමක් නොවේද?

අවම භාවිතය, නැවත භාවිතය හා ප්‍රතිචක්‍රිකරණය යන කසළ පාලනයේ ජාත්‍යන්තර මූලධර්මවලට අනුගත වෙමින් එම වගකීම ඉටුකිරීමට පාසැල් වයසේ සිටම අප උනන්දු විය යුතුය. ඒ සඳහා අපගේ දෙමව්පියන්, ඥාතීන්, මිත්‍රයන් හා අනෙකුත් වැඩිහිටියන්ට මඟ පෙන්වීමද පාසැල් ගුරු - ශිෂ්‍ය ප්‍රජාවේ වගකීමක් ලෙස "විදුරාව" දකියි.

**තුසිත මලලසේකර**